025

සියලු හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 08 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය

නම/විභාග අංකය :- ........................................................................................ කාලය: පැය 02 යි.

### I කොටස

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශුද්ධ ස්වර පමණක් ඇසුරු කරගනිමින් ගැයෙන ස්වර ස්ථාපන ගීතයකි.
(1) පොසපත කියවං නුවණ ලබා (2) සිරස නමමු මව පොළොවට
(3) පිරිපාර අතියාන්ත (4) ප්‍රංචි තාරකා...

(02) ස රි ග ප ධ ස් යන ස්වර පමණක් යොදා ගනිමින් ගැයෙන ස්වර ස්ථාපන ගීතයකි.
(1) සිරස නමමු මව පොළොවට (2) ඇතැළමහට ඇතැළ ගසක
(3) මැතිනා සිරිපා කරුණා කරනා (4) සවන පිනන ගීත මිහිර

(03) x x - / x x x - / x x - / x x x -
ඉහත රිද්ම රටාවට ගැළපෙන හින්දුස්ථානි තාලය,
(1) දාදරා තාලය (2) කෙහෙර්වා තාලය (3) ඡප් තාලය (4) දීප්චන්දි තාලය

(04) සිරිසඟබෝ නූර්තියේ නිර්මාණකරුවා වන්නේ,
(1) සී.දොන් බස්තියන් මහතා (2) ජෝන් ද සිල්වා මහතා
(3) චාර්ල්ස් ඩයස් මහතා (4) ලයනල් අල්ගම මහතා

(05) සාන්තාවන්ට පූර්වශේෂී වූ කාර්යයක දී ගැයූ මෙම කවි මෙගෙ ගී විශේෂයකි.
(1) තමත් කවි (2) නෙළුම් කවි (3) කළගෙඩි කවි (4) මළිඳු කවි

(06) "කෙල්ලාලා හිස පිරන් නැතෝ.... මෙම පද යොදා ගනිමින් ජන ගී ආශ්‍රිත සරල ගීතයක් ගයන්නේ,
(1) අරිසෙන් අහුබුදු මහතා (2) සුනිල් සාන්ත මහතා
(3) ලයනල් අල්ගම මහතා (4) ඩබ්.ඩී.අමරදේව මහතා

- පහත කවි පාද කොටස ඇසුරින් 07 , 08 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ශු ද් ධ / ං ස ර / ණේ s s / s s s

(07) ඉහත කවි පාද කොටසේ ඇති පදැස්මත් හා ගී මත් ගණන පිළිවෙලින්,
(1) 6. 8 (2) 7. 8 (3) 7 . 12 (4) 8 . 12

(08) මෙම කවි පාද කොටසේ යෙදී ඇති පූර්ණ යති මාත්‍රා ගණන වනුයේ,
(1) 3 (2) 5 (3) 6 (4) 7

(09) 0 , ⅃ මෙම බටහිර සංකේත දෙකෙහි මාත්‍රා වටිනාකම පිළිවෙලින්,

(1) 4 , 2 (2) 2 , 4 (3) 1 , 2 (4) 2, 3

(10) නාඩගම් නාට්‍ය සඳහා යොදාගත් ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) තබ්ලාව (2) මද්දලය (3) රබාන (4) ඩෝලය

- නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරාගෙන හිස්තැන් පුරවන්න.

(දීප්චන්දි, සිතාර්, අම්මා සඳකි, ජප්, දිකිරි දිකිරි)

(11) හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය ........................................................ වේ.

(12) ආවර්තයේ මාත්‍රා 14ක් යෙදී ඇති තාලය ........................................................ තාලයයි.

(13) ........................................ තාලයේ මාත්‍රා බෙදීයන්නේ පුළු - මැදුම් දෙකිතට සමානව ය.

(14) ........................................ ගීතය රතුහැට්ටකාරී නාට්‍යයේ ඇතුළත් ගීතයකි.

(15) ........................................ ගීතය ටී.එම්.ජයරත්න මහතා විසින් ගයන ගීතයකි.

- පහත සඳහන් වගන්ති හරි නම් "✓" ලකුණ ද වැරදි නම් "×" ලකුණ ද වැකිය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(16) "ගජන් ගායනා" දකුණු ඉන්දියාවේ ප්‍රචලිත වූවකි. ( )

(17) වංග සංගීතයේ නිර්මාතෘවරයා රවීන්ද්‍ර නාත් තාගෝර්තුමා වේ. ( )

(18) කුම්බාවේ මුහුණත සමකින් ආවරණය වූ සිතාරයේ, ප්‍රධාන තත නායකීතාර් වේ. ( )

(19) සම්ග්‍රහය යනු තාලයක ප්‍රබල ස්ථානය වේ. ( )

(20) දෙකිතට අයත් තාලරූප තුනක් වේ. ( )

## II කොටස

### පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) රාග ආශ්‍රිත ස්වර ප්‍රස්තාර ගීත දෙකක මුල් ස්වර පාද කොටස් පහත දැක්වේ.

(a) / ස රි / ග - ම / ප ප / ප - ධ /

(b) / ග ම ප / ග ම රි / ස රි ග / රි ස ස /

(i) ඉහත a, b ස්වර ප්‍රස්තාර ගීතවලට අයත් රාග නම් කරන්න.

(ii) මින් එක් ගීතයක ස්ථායී කොටසේ ස්වර හා ගීතය ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත a, b ස්වර පාදවලට ගැළපෙන පද්‍ය රචනා දෙකක් නිර්මාණය කරන්න.

(02) (i) පහත සඳහන් ගී පද අයත්වන තාල නම් කරන්න.

(a) මොකද මැණිකේ හනික යන්නේ

(b) දකින විට පන්සලක්

(c) සිරි සාර අහි ගාන්න

(d) සිතකවෙන් හෝ කතාවෙන් බෑ

(ii) ඔබ නම් කළ තාල අතරින් මැදුම් මඟ දෙතිතට සමාන වන තාලයේ ලඝුකාවනියමිත තාල සංකේත යොදා ප්‍රස්තාර කරන්න.

(iii) මේවා කෙටියෙන් හඳුන්වන්න.

(1) විතාල (2) සමග්‍රහ (3) බලිය (4) අනුතාල

(03) (i) නූර්ති නාට්‍ය තුළ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න.

(ii) පොෂෙත් ගුරු සහ අස්වැල් ගායක කණ්ඩායමක් පිවිත නාට්‍ය විශේෂය නම් කරන්න.

(iii) ඉහතින් සඳහන් වන නාට්‍ය කුම දෙකට අයත් ගීත දෙකක මුල් කොටස බැගින් ලියන්න.

(iv) ඔබ දන්නා නව නාට්‍ය ගී දෙකක් නම් කරන්න.

(04) (i) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ගීතයට අදාළ තොරතුරු | ගීයේ නම |
|---|---|
| (a) විවිධ කාර්යයන්හි නිරතවීමේ දී ගැමියන් විසින් ගැයූ ගීත | .................................................. |
| (b) කුඹුරේ වල්පැල ගැලවීම, අඩු තැන්වලට පැළ සිටුවීම හා ගොයම් පැළ සිටුවීමේ දී ගයන ගීත | .................................................. |
| (c) ගොයම් පැගීමේ දී ගයන ලද ගීත | .................................................. |

(ii) වගුවේ (a) කොටසට අදාළ ගීත විශේෂයේ දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න.

(iii) වගුවේ (B) කොටසට අයත් ගීතයක මුල් පාද හතර ලියන්න.

(iv) වගුවේ (c) කොටසට අදාළ ගීතයක මුල් පාද දෙක ලියන්න.

(05) (i) පහත දී ඇති ගී පාද දෙක හොඳින් කියවා ඒව ගැළපෙන තවත් ගී පාද දෙකක් නිර්මාණය කරන්න.

/ දුර අ / හ පේ s / සඳ පා / s යා s /

/ දසත / මපද / ඊ ජ්පි / රි ලා s /

/ - - - / - - - / - - - / - - - /

/ - - - / - - - / - - - / - - - /

(ii) " ස රි ග ම " යන ස්වර හතර පමණක් යොදාගෙන පහත ගී පාදය සඳහා සුදුසු තනුවක් නිර්මාණය කරන්න.

/ සප / තස / ගග / ශශ /
/ මල / වට / රග / මෙදන /
/ - - / - - / - - / - - /
/ බඹ / රුන් / කවි / සර /

(iii) මාත්‍රා දෙක හා තුන බැගින් යොදා නැගෙන ගීත නම් කරන්න.

(iv) එම ගීතට අයත් උදාහරණ පදය ප්‍රස්තාර කරන්න.

(06) (i) අපරදිග සංගීතයට අයත් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අපරදිග නාමය | සංකේතය | වටිනාකම |
|---|---|---|
| 1. ........................ | ........................ | මාත්‍රා හතරයි |
| 2. ........................ | 𝅗𝅥 | 2 ........................ |
| 3. ක්‍රොචට් (crochet) | ........................ | 3. ........................ |
| 4. ........................ | 𝅘𝅥𝅮 | 4. ........................ |

(ii) පහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

